## පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
## යාපනය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය පකාශන 2010 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

ආදායම , වියදම හා වත්කම් වලට අදාළව ගිණුම්වල නිරීක්ෂණය වූ ගණම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | මූල්‍ය ප්‍රකාශන වලට බලපෑම | | | | | |
|---|---|---|---|---|---|---|
| | ආදායම | | වියදම | | වත්කම් | |
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 01 | 2,579 | 03 | 116,073 | - | - |
| ගිණුම්වල වූ වර්ගීකරණ දෝෂ | - | - | - | - | 01 | 13,700 |

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,426,108 ක් විය.

### 1.3.4 විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.2,377,723 ක වු ගනදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමු | අනුකූල නොවීම |
|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | ආගමික හා පොදු වැඩ සඳහා වර්ෂයකට රු.1,000 කට වඩා වියදම් දැරීමේදී විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.4,895 ක මුදලක් ආහාරපාන සඳහා වැයකර තිබුණි. |

**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති)**

| | |
|---|---|
| 5 රීතිය | සභාවේ මුදල් හා ගබඩා පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| 140 රීතිය | රු.911,036 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. |
| 2009 ජනවාරි 20 දිනැති අංක පීටී/01/2009 දරන උතුරු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව සමීක්ෂණ මණ්ඩල දීමනා ලෙස රු.2,100 ක් සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන්ට ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,017,873 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,737,482 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,580 | 74 | 587 | 50 | 54 | 533 |
| බදු කුලී | 1,010 | 1,477 | 215 | 980 | 1,054 | 235 |
| බලපත්‍ර ගාස්තු | 153 | 197 | - | 1,650 | 110 | - |
| වෙනත් ආදායම් | 22,182 | 29,465 | 10 | 19,061 | 1,557 | 12 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ පේදුරු තුඩුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා එකතු කර ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කරන ලද රු.4,399,409 ක් වූ උසාවි දඩ මුදල අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2) (ආ) වගන්තිය ප්‍රකාරව අයකරන ලද මුද්දර ගාස්තු සභාවට ලැබී නොතිබුණු අතර රෙජිස්ටාර් ජනරාල් විසින් මුද්දර ගාස්තු උපලේඛනයද සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම හා විචලනයන් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **2010** | | | **2009** | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගල පඩිනඩි | 15,550 | 9,049 | 6,501 | 15,800 | 8,944 | 6,856 |
| අනෙකුත් | 4,206 | 2,146 | 2,060 | 4,755 | 2,593 | 2,162 |
| උප එකතුව | 19,756 | 11,195 | 8,561 | 20,555 | 11,537 | 9,018 |
| ප්‍රාග්ධන වියදම් | 7,669 | 10,740 | (3,071) | 3,056 | 2,012 | 1,044 |
| මුළු එකතුව | 27,425 | 21,935 | 5,490 | 23,611 | 13,549 | 10,062 |

## 2.4 හිඟ ආදායම්

2010 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂ වලට අදාලව ලැබිය යුතු රු.812,000 ක් වු වරිපනම් බදු , බදු කුලී හා වෙනත් ආදායම් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා 1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන ) රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

සභාවේ 2010 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | 02 | 02 |
| ද්විතීයික ශ්‍රේණි | 13 | 13 |
| ප්‍රාථමික ශ්‍රේණි | 23 | 19 |
| වෙනත් | - | 15 |
| එකතුව | 38 | 49 |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2:6:1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.911,035 ක් වු අතර වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මව ලැබිය යුතු ගිණුම් ශේෂ රු.11,150 ක් විය.

### 2:6:2 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශෙෂවල එකතුව රු.2,144,063 ක් වූ අතර වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි පැවති ගිණුම් ශේෂ රු.141,150 ක් විය.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රු345,666 ක් වු සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල දායකය අදාළ අරමුදල වලට පේෂණය කර නොතිබුණි.

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනය

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දීර්ඝ ප්‍රමාදයන් තිබු බව නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කිරීමට ඉලක්ක කළ දිනය | 2010 දෙසැම්බර් 31 දක්වා දරන ලද වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | | |
| වීරකාති පිල්ලෙයාර් කෝවිල් වීථිය ඉදිකිරීම | 985,219 | 2010 සැප්තැම්බර් 09 | 2010 දෙසැම්බර් 31 | නැත | ප්‍රසම්පාදන පරිපාටිය ප්‍රමාදවීම |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ | 434,113 | 2010 දෙසැම්බර් 03 | 2010 දෙසැම්බර් 31 | නැත | ප්‍රසම්පාදන පරිපාටිය ප්‍රමාදවීම |

## 2.9 සම්පූර්ණයෙන් අත්හරින ලද ව්‍යාපෘති

පහත දැක්වෙන ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2010 දෙසැම්බර් 31 දක්වා දරන ලද වියදම | අත් හැරීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| පොදු වැසිකිළිය ඉදිකිරීමේ වැඩ | 238,617 | 2010 ඔක්තෝබර් 05 | - | ඉදිකිරීම් ද්‍රව්‍ය නොලැබීම |

## 2.10 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ). මෝටර් වාහන උපයෝජනය

(ඉ). අයවැය පාලනය